**මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගම - 2022**

----------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගමේ ("සමාගම") හි 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

2022 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ ඒදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය

හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5** මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

## 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ සේවකයින්ට ලබාදෙනු ලබන ණය පහසුකම් සහ එහි අයකර ගැනීම් සමාගමේ පොත්වල සටහන් කර නොතිබුණි. ඒ වෙනුවට එම ශේෂයන් මව් සමාගමේ (ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමේ) පොත්වල සටහන් කර තිබුණි. **2022** දෙසැම්බර් **31** දිනට කාර්ය මණ්ඩල ණය ශේෂය රු. **155,295,603** ක් විය. | ණය ලෙජරයක් පවත්වාගෙන යාම දැනටමත් ආරම්භ කර ඇත. | සේවකයන්ට ලබාදෙන ණය පහසුකම සේවක ප්‍රතිලාභවල කොටසක් වේ. එබැවින් කාර්ය මණ්ඩල ණය සමාගමේ පොත්වල සටහන් කිරීමට කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |

## 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල (රු.) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ.) | වෛද්‍ය නිවාඩු සඳහා දීමනා | **23,572,912** | ගෙවීම් කිරීම සඳහා අනුමත කරනලද ආයතනික ප්‍රතිපත්තිය හෝ අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය | සමාගමේ අතීත පරිචය අනුව අසනීප නිවාඩු ගෙවා ඇත. | කළමනාකරණය විසින් මේ සඳහා නියමිත ප්‍රතිපත්තියක් සකස්කර අදාළ පරිදි අධිකාරී බලය ලබාගැනීමට කටයුතු කළයුතුය. |
| (ආ.) | වාහන ණය | 75,802,708 | අනුමත අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්තිය | | |
| (ඇ.) | ආපදා ණය | 79,492,895 | අනුමත අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්තිය | | සමාගම විසින් විධිමත් ප්‍රතිපත්ති සකස් කර සේවක ප්‍රතිලාභ යෝජනා ක්‍රම සැකසීම සඳහා අදාළ බලධාරීන්ගෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. |
| (ඈ.) | ප්‍රසාද දීමනා ගෙවීම | 39,377,303 | අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව | කළමනාකාරිත්වය විසින් පිළිතුරු ලබා දී නොමැත. | |
| (ඉ.) | තෑගි වවුචර ගෙවීම් | 1,305,000 | අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව | | |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

| | | |
|---|---|---|
| 2020 අංක 04 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත අනුව ආර්ථික සේවා ගාස්තු අයකිරීම 2020 ජනවාරි මස 01 දින සිට අත්හිටුවා ඇත. නමුත් 2022 දෙසැම්බර් 31 දින නිරවුල් කිරීම සඳහා සුදුසු පියවර ගැනීමට අපොහොසත් වූ රු. 4,346,862 ක ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු වටිනාකමක් සහ රු. 1,940,901 ක ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු වටිනාකමක් ගිණුම්වල නිරීක්ෂණය විය. | මේ සම්බන්ධයෙන් යොදා තිබූ ජනල් සටහන මගින් සිදුවූ බලපෑම නිවැරදි කිරීමට කටයුතු කරන අතර නැවත ජනල් සටහන් යෙදීමට පෙර නිසි අනුමැතිය ලබාගැනීමට කටයුතු කරනු ඇත. | කළමනාකරණය විසින් මෙම ශේෂයන් නිරවුල් කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. |

**1.7** නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්ව යේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ.) | 1935 වෘත්තීය සමිති ආඥා පනතේ 8(1) සහ 8(2) වගන්ති සමග කියවිය යුතු 1935 ඔක්තෝම්බර් 25 දිනැති අංක 8160 දරන ගැසට්පත්‍රය. | විධායක වැටුප් ගෙවීම සඳහා වන සාමූහික ගිවිසුමේ පාර්ශවකරුවන් වී ඇති වෘත්තීය සමිති 6ක්, නියමිත පරිදි වලංගු ලියාපදිංචියක් සහිත, ක්‍රියාකාරී වෘත්තීය සමිති බවට තහවුරු කිරීම සඳහා වන,0 කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනය වෙත ඉදිරිපත් වී නොමැත. | මේ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වගකිවයුතු නිලධාරීන් වෙත දැනටමත් යොමු කර ඇත. | සාමූහික ගිවිසුමට එළඹීමට පෙර අදාළ වෘත්තීය සමිති ක්‍රියාකාරී සහ වලංගු වෘත්තීය සමිති දැයි පරීක්ෂා කළ යුතුයි. |
| (ආ.) | යහපාලන මනා පරිචයන් පිළිබඳ මාර්ගෝපදේශය 2017 | B.3 වගන්තියට අනුව, සමාගමේ වාර්ෂික වාර්තාවේ වැටුප් ප්‍රතිපත්තිය පිළිබඳ වාර්තාවක් අඩංගු විය යුතුය. කෙසේ වෙතත්, සමාගමේ සහ මව් සමාගමේ වේතන ප්‍රතිපත්තිය මව් සමාගමේ වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කර නොතිබූ බව නිරීක්ෂණය විය. | කළමනාකාරිත්වය විසින් පිළිතුරු ලබා දී නොමැත. | |

**2.** මූල්‍ය සමාලෝචනය

**2.1** මූල්‍ය ප්‍රතිඵල

මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ පෞද්ගලික සමාගම විසින් දරන ලද සියලුම වියදම් සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ප්‍රතිපූරණය කර ඇත. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා කිසිදු ලාභයක් හෝ අලාභයක් ඇතිවී නොතිබුණි. සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය අනුව පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සමාගම පිහිටුවා ඇත.

- රක්ෂණ කළමනාකරණය සහ තාක්ෂණික සේවා සැපයීම.
- රක්ෂණ සහ උපදේශන සේවා සැපයීම.
- රක්ෂණ පර්යේෂණ සහ සංවර්ධන සේවා සැපයීම.
- සාමාන්‍ය කළමනාකරණ සහ උපදේශන සේවා සැපයීම.

**2.2** ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| ගිණුම් අයිතමය | වටිනාකම | | විචලනය | | වර්ධනය/ පසුබෑම | |
|---|---|---|---|---|---|---|
| | 2022 | 2021 | 2022 | 2021 | 2022 | 2021 |

| | රු . 000 | රු. 000 | රු . 000 | රු. 000 | % | % |
|---|---|---|---|---|---|---|
| කළමනාකරණ ගාස්තු | **783,149** | 739,905 | **43,244** | 38,983 | **5.8%** | 5.6% |
| වැටුප් | **329,201** | 304,247 | **24,954** | 11,157 | **8.2%** | 3.8% |
| සමස්ත කාර්ය මණ්ඩල වියදම | **756,065** | 729,351 | **26,714** | 35,600 | **3.7%** | 5.1% |
| සේවක සංඛ්‍යාව | **91** | 85 | **06** | 05 | **7.1%** | 6.25% |

**2.3 අනුපාත විශ්ලේෂණය**

| අනුපාතය | 2022<br>රු . | 2021<br>රු . | 2020<br>රු . | 2019<br>රු . |
|---|---|---|---|---|
| එක් මාසයක් සඳහා සේවකයෙක් වෙනුවෙන් වියදම | 692,619 | 715,148 | 722,658 | 683,284 |
| සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ දළ ලිඛිත වාරික ආදායමේ ප්‍රතිශතයක් ලෙස කාර්ය මණ්ඩල වියදම | 1.83% | 1.69% | 1.76% | 1.70% |
| සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වාර්ෂික ශුද්ධ ලාභයේ ප්‍රතිශතයක් ලෙස කාර්ය මණ්ඩල වියදම | 7.17% | 7.26% | 11.98% | 8.17% |

**3.මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ආයතනයේ අරමුණු ඉටුකරගැනීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය අනුව සමාගමේ අරමුණු වන්නේ රක්ෂණ කළමනාකරණය සහ තාක්ෂණික සේවා සැපයීම, රක්ෂණ උපදේශන සහ උපදේශන සේවා සැපයීම, රක්ෂණ පර්යේෂණ සහ සංවර්ධන සේවා සැපයීම සහ මව් සමාගම සඳහා සාමාන්‍ය කළමනාකරණ සහ උපදේශන සේවා සැපයීමයි. නමුත් එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සමාගම අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | මැනේජ්මන්ට් සර්විසස් (රක්ෂණ) සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමට කළමනාකරණය සැලසුම් කරමින් සිටින අතර ඒ අනුව මෙම අරමුණු නව ව්‍යුහය යටතේ සාකච්ඡා කෙරේ. | කළමනාකාරිත්වය විසින් සමාගමේ අරමුණු ඉටු කරගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ.) | සමාගමේ එක් අරමුණක් වන්නේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන කළමනාකරණ | සමාගමේ සංවිධාන ව්‍යුහය සකස් කර ඇති අතර, විගණනයට | සමාගම හරහා බඳවාගැනීමට සහ යොමු |

| | | | |
|---|---|---|---|
| | තනතුරු සඳහා බඳවාගැනීම සහ අනුයුක්ත කිරීමයි. කෙසේවෙතත් සමාගම විසින් බඳවා ගැනීමට අවශ්‍ය ප්‍රධාන කළමනාකරණ තනතුරු සමාගම විසින් හඳුනාගෙන නොතිබුනි. තවද සමාගමේ සංවිධාන ව්‍යුහය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරිපත් කෙරෙනු ඇත. | කිරීමට අවශ්‍ය ප්‍රධාන කළමනාකරණ තනතුරු සමාගම විසින් හඳුනාගත යුතුය. |
| (ආ.) | වැටුප් ලේඛනයට අනුව 2022 දෙසැම්බර් 31 දිනට සමාගමේ නිලධාරීන් 91 ක් වන අතර එම නිලධාරීන් මව් සමාගම වෙත අනුයුක්ත කර තිබුණි. නමුත් එම නිලධාරීන්ගේ රැකියා විස්තර සම්බන්ධයෙන් තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | මානව සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සෑම සේවකයෙකුටම රැකියා විස්තරය සපයා ඇති බවට තහවුරු කරන අතර, එම රැකියා විස්තර පිටපත් පෞද්ගලික ලිපිගොනුවලට ඇතුළත් කිරීමට අවශ්‍ය විධිවිධාන යෙදීමට කටයුතු කරනු ඇත. | සමාගම විසින් එක් එක් සේවකයාගේ කාර්යයන් සහ වගකීම් හඳුනාගෙන සියලුම නිලධාරීන්ට රැකියා විස්තර නිකුත් කළ යුතුය. |
| (ඇ.) | සමාගම විසින් 2022 වර්ෂය සඳහා බඳවා ගැනීමේ සැලැස්මක් පිළියෙල කර නොමැත. වැටුප් ලේඛනයට අනුව සමාලෝචිත වර්ෂය තුළ කළමනාකරණ තනතුරු දෙකක් (02) විශ්‍රාමයාම / ඉල්ලා අස්වී ඇත. තවද සමාලෝචිත වර්ෂය තුළදී පුද්ගලයන් හය දෙනෙකු (06) සමාගම සඳහා බඳවාගෙන මව් සමාගම වෙත අනුයුක්ත කර ඇත. | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ උපායමාර්ගික සැලසුම් සහ ව්‍යාපාරික අවශ්‍යතා මත බඳවාගැනීම් සිදු කරයි. | සමාගම සතුව නියමිත බඳවාගැනීමේ සැලැස්මක් පැවතිය යුතුය. |
| (ඈ.) | 2019 දෙසැම්බර් 01 සිට 2022 ඔක්තෝබර් 31 දක්වා කාලය සඳහා අත්සන් කරන ලද සාමූහික ගිවිසුම අවලංගු වී ඇත. කෙසේ වෙතත්, සමාගම 2023 මාර්තු 15 වන දින වන විටත් නව සාමූහික ගිවිසුමට අත්සන් කර නොතිබුණි. තවද, සාමූහික ගිවිසුම යටතේ ආවරණය වූ සේවකයින් සඳහා වැටුප් සැකසීම සඳහා අවලංගු වූ සාමූහික ගිවිසුම භාවිතා කර තිබුණි. | කළමනාකාරිත්වය විසින් පිළිතුරු ලබා දී නොමැත. | සේවකයින්ට වැටුප් ගෙවීම විධිමත් කිරීමට කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර ඇත. නමුත් අභ්‍යන්තර විගණන වාර්තාව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | එහි කටයුතු අවසන් වූ පසු විගණන වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ | අභ්‍යන්තර විගණන වාර්තාව විගණනයට ඉදිරිපත් කළ යුතුය. |